මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.02.01
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් **தொலைபேசி/ தொலைநகல்** Telephone / Fax:- 041-2240208

## මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
## 2022.01.11 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදය ශාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 ජනවාරි මස මාසික සභා රැස්වීම 2022.01.11 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2021.12.14 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

**ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා**
15 වන පිටුවේ 6:3 යෝජනාව ස්ථිර කරන අවස්ථාවේ කලබලකාරී තත්ත්වයක් ඇතිවුනා. ඒ අවස්ථාවේ ඒ නිසා සභාපතිතුමා විසින් සභාව කල් දැමුවා. එය ඇතුලත් කරන්න.

**ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා**
15 වන පිටුවේ කාරක සභා අවස්ථාවක් පැමිණීම සඳහන් කර නැහැ එය ඇතුලත් කල යුතුයි. ඒ වගේම වරප්‍රසාද කඩකිරීම සම්බන්ධව මම කථා කළා. ඒ කථාව ඇතුලත් කර නෑ.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**
විමලවංශ මන්ත්‍රීතුමා, සම්මත නොවූ යෝජනාවක් ගැන කථාකිරීමට පනතේ ප්‍රතිපාදන නැති බැවින් එම කථාව ඇතුලත් කලේ නෑ.

ඉහත සංශෝධන වලට යටත්ව 2021.12.14 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව 2021.12.14 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

***02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

***03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- මාතර, කඹුරුගමුව, ගුණසේකර මාවත, නො.269/ඒ ජයසේකර චන්ද්‍රසිරි යන අය විසින් 2022.01.10 දිනැති “පොදු කටයුතු සඳහා ඉඩම් කොටසක් ලබාදීම සම්බන්ධව” යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- තෙලිජ්ජවිල, කොටදූපේ, වැකඩමුල්ලදෙනිය හි පරණවිතානගේ චන්ද්‍රාවතී යන අය විසින් "මායිම් ආරවුලක් සම්බන්ධව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- තෙලිජ්ජවිල, හොරගොඩ, භාග්‍යාගම, නො.38, එච්.කේ.තනූජා දර්ශනි යන අය විසින් "භාග්‍යාගම කනත්ත පාරෙහි කාණු සකස් කර ගැනීම සඳහා" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් අංක SLILG/10/DIP/CD/2022 හා 2021.12.16 දිනැති “ප්‍රජා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2022 අධ්‍යයන වර්ෂය” යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- "ඩෙංගු උවදුර දුරලමු" යන මැයෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2022.01.11 දින සිට 2022.01.17 දින දක්වා ක්‍රියාත්මක වන පවිත්‍රතා සතිය පිළිබඳ දැන්වීම සභාගත කරන ලදී.

***04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

**යෝජනා අංක 5:1**
2021/12/01 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:1**
2021/12/01 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2021/12/14 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2021/12/14 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ විගණන කළමනාකරණ කමිටුව සඳහා පහත නම් සඳහන් අය සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

- සෝමසිරි වීරමන් මයා - සභාපති
- එච්.එච් අසංකා කුමාරි මිය - ලේකම්
- සජීවනි පල්ලියගුරු මිය - අභ්‍යන්තර විගණන නිලධාරි
- පූර්ණිමා ප්‍රියදර්ශණි මිය - කළමනාකරණ සේවා නිලධාරි
- ජේ.ඩබ්.එල් සෙව්වන්දි මිය - සංවර්ධන නිලධාරි

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ විගණන කළමනාකරණ කමිටුව සඳහා පහත නම් සඳහන් අය සුදුසු බවට තීරණය විය.

- සෝමසිරි වීරමන් මයා - සභාපති
- එච්.එච් අසංකා කුමාරි මිය - ලේකම්
- සජීවනි පල්ලියගුරු මිය - අභ්‍යන්තර විගණන නිලධාරි
- පූර්ණිමා ප්‍රියදර්ශණි මිය - කළමනාකරණ සේවා නිලධාරි
- ජේ.ඩබ්.එල් සෙව්වන්දි මිය - සංවර්ධන නිලධාරි

**<u>යෝජනා අංක 5:4</u>**

2022 වර්ෂය සඳහා දේපල ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් නොවූ දේපළ නැවත ප්‍රාදේශීය වශයෙන් ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:4</u>**

2022 වර්ෂය සඳහා දේපල ටෙන්ඩර් කිරීමේදී ටෙන්ඩර් නොවූ දේපළ නැවත ප්‍රාදේශීය වශයෙන් ටෙන්ඩර් කිරීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:5**

අධිකාරිවිලගම ප්‍රජාශාලාව මතට පතිත වී ඇති ගස්වල අතු කපා ඉවත් කිරීම සුදුසු බවටත් වහලයේ බිඳී ඇති උළු කැට ඉවත් කර, නව උළුකැට තබා වහල පිළිසකර කිරීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:5**

අධිකාරිවිලගම ප්‍රජාශාලාව මතට පතිත වී ඇති ගස්වල අතු කපා ඉවත් කිරීම සුදුසු බවටත් වහලයේ බිඳී ඇති උළු කැට ඉවත් කර, නව උළුකැට තබා වහල පිළිසකර කිරීම සුදුසු බවටත් තීරණය විය.

**යෝජනා අංක 5:6**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ සහන පදනම මත සේවය කල එහෙත් අසනීප තත්වය නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වූ අයෝමි චන්දිමා දිල්රුක්ෂි මිය මාසිකව රු.5000ක දීමනාවක් ගෙවීමට යටත්ව සේවා කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:6**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ සහන පදනම මත සේවය කල එහෙත් අසනීප තත්වය නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වූ අයෝමි චන්දිමා දිල්රුක්ෂි මිය මාසිකව රු.5000ක දීමනාවක් ගෙවීමට යටත්ව සේවා කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවට තීරණය විය.

**යෝජනා අංක 5:7**

තෙලිජ්ජවිල වල්පිට ප්‍රධාන මාර්ගයේ සිට තෙලිජ්ජවිල වත්ත යන ඉඩමට ඇති අතුරු පිවිසුම් මාර්ගය සභාවේ ලියාපදිංචි පොදු මාර්ගයක් ලෙස පිළිගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 5:7**

තෙලිජ්ජවිල වල්පිට ප්‍රධාන මාර්ගයේ සිට තෙලිජ්ජවිල වත්ත යන ඉඩමට ඇති අතුරු පිවිසුම් මාර්ගය සභාවේ ලියාපදිංචි කිරීම සුදුසු බවට තීරණය විය.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

__යෝජනා අංක 6:1__
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අනුබද්ධිතව ආරම්භ කරන ලද පහත නම් සඳහන් ප්‍රජා මණ්ඩලය පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

- අකුරුගොඩ නැගෙනහිර සවිය ප්‍රජා මණ්ඩලය

  යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
  ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

__තීරණ අංක 6:1__
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අනුබද්ධිතව ආරම්භ කරන ලද පහත නම් සඳහන් ප්‍රජා මණ්ඩලය පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි කිරීමට තීරණය විය.

- අකුරුගොඩ නැගෙනහිර සවිය ප්‍රජා මණ්ඩලය

__යෝජනා අංක 6:2__
අකුරුගොඩ නැගෙනහිර මැදගොඩ ප්‍රජා ශාලාව සඳහා වැසිකිලියක් ඉදිකිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

__තීරණ අංක 6:2__
අකුරුගොඩ නැගෙනහිර මැදගොඩ ප්‍රජා ශාලාව සඳහා වැසිකිලියක් ඉදිකිරීම සුදුසු බවටත්, ඒ සඳහා රු.700,000.00 ක දළ ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවටත් තීරණය විය.

__යෝජනා අංක 6:3__
අධිකාරිවිලගම ප්‍රජා ශාලාව සඳහා විදුලි සැපයුම ලබා දීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

__තීරණ අංක 6:3__
අධිකාරිවිලගම ප්‍රජා ශාලාව සඳහා විදුලි සැපයුම ලබා දීමට තීරණය විය.

__යෝජනා අංක 6:4__
හොරගොඩ භාග්‍යගම ක්‍රීඩා පිටිය සහ අධිකාරිවිලගම ප්‍රජා ශාලාව පිහිටි ඉඩම් සභාව වෙත පවරා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂගේ අංක PRO/AKU/01 හා 2022.01. දිනැති ලිපිය මගින් 2021/01 පාලන චක්‍ර ලේඛයේ පරිදි පර්.01ක් සඳහා රු. 200.00 බැගින් ලබා දීමට සුදුසු බවට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

හොරගොඩ භාග්‍යගම ක්‍රීඩා පිටිය සහ අධිකාරිවිලගම ප්‍රජා ශාලාව පිහිටි ඉඩම් සභාව වෙත පවරා ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂගේ අංක PRO/AKU/01 හා 2022.01. දිනැති ලිපිය මගින් 2021/01 පාලන චක්‍ර ලේඛයේ පරිදි පර්.01ක් සඳහා රු. 200.00 බැගින් ලබා දීමට සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 6:5</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක 04/04/09/01 හා 2021.12.31 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි මාලිම්බඩ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර කුලිය 2021අගොස්තු 21 දින සිට 2021 සැප්තැම්බර් මස 30 දින දක්වා තවත් මාස ½ කින් බදු මුදල් අය නොකිරීම සුදුසු බවට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

2021 වර්ෂයේ කොරෝනා වසංගතය හේතුවෙන් මාස 2 ½ දක්වා කඩ කුලී මුදල් නිදහස් කිරීමට ගනු ලැබූ තීරණය මාස 03ක් දක්වා වැඩි කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

මැදගොඩ ප්‍රජා ශාලාවට අවශ්‍ය පුටු 10ක් හා මේස් 05ක් ලබා දීමටත් ඒ සඳහා පහත ඇස්තමේන්තුව අනුමත කිරීමටත් ගරු සභාවට යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| මේස් 05 ක් සඳහා | - රු.4000.00*5 | = 20000.00 |
| පුටු 10 ක් සඳහා | - රු.1000.00*10 | = 10000.00 |
| එකතුව | - | = <u>30000.00</u> |

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

මැදගොඩ ප්‍රජා ශාලාවට අවශ්‍ය පුටු 10ක් හා මේස් 05ක් ලබා දීමටත් ඒ සඳහා පහත ඇස්තමේන්තුව අනුමත කිරීමටත් තීරණය විය.

| | | |
|---|---|---|
| මේස් 05 ක් සඳහා | - රු.4000.00*5 | = 20000.00 |
| පුටු 10 ක් සඳහා | - රු.1000.00*10 | = 10000.00 |
| එකතුව | - | = <u>30000.00</u> |

**<u>යෝජනා අංක 6:7</u>**

හොරගොඩ පොල්පිටිය එකමුතු මාවත සංවර්ධනය කිරීම සඳහා ස්ථාන කිහිපයකම අවශ්‍යා පළල නොමැති බැවින් යන්ත්‍රයක් යොදා පාර පුළුල් කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයශාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**

හොරගොඩ පොල්පිටිය එකමුතු මාවත සංවර්ධනය කිරීම සඳහා ස්ථාන කිහිපයකම අවශ්‍යා පළල නොමැති බැවින්ද සභාවේ ජේ.සී.බී යන්ත්‍රය අක්‍රීය වී ඇති බැවින්ද පෞද්ගලික ජේ.සී.බී යන්ත්‍රයක් යොදා පාර පුළුල් කිරීමට තීරණය විය

**<u>යෝජනා අංක 6:8</u>**

හොරගොඩ ලිබර්ටි ටෙරන්ස් ගම්මානයේ මාර්ග පද්ධතියේ කාණු නොමැති කමින් දැඩි සෝදා යාමකට ලක්ව ඇති බැවින් යන්ත්‍රයක් යොදා කාණු කැපීමට ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයශාන්ත මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:8</u>**

හොරගොඩ ලිබර්ටි ටෙරන්ස් ගම්මානයේ මාර්ග පද්ධතියේ කාණු නොමැති කමින් දැඩි සෝදා යාමකට ලක්ව ඇති බැවින් යන්ත්‍රයක් යොදා කාණු කැපීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:9</u>**

ගැමුණු මාවතේ බෝගස ඉවත් කිරීමටත්, අඹගහගොඩ මාර්ගයේ ඉඹුල්ගස ඉවත් කිරීමටත් ගරු සභාව යෝජනා කරන්නීය.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:9</u>**

ගැමුණු මාවතේ බෝගස ඉවත් කිරීමටත්, අඹගහගොඩ මාර්ගයේ ඉඹුල්ගස ඉවත් කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:10</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත නම් සඳහන් අයගෙන් යුත් ළමා හා කාන්තා ආරක්ෂණ කමිටුවක් පිහිටුවීමට ගරු සභාව යෝජනා කරන්නීය.

01. කමිටු සභාපති - සෝමසිරි වීරමන් මයා, සභාපති, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
02. කමිටු ලේකම් - එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය, ප්‍රජා සංවර්ධන නිලධාරී මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
03. අනුශාසක - i. ගරු ධම්මසිරි ස්වාමීන් වහන්සේ, විහාරාධිපති, ඉන්ද්‍රාරාම පුරාණ විහාරය, මාලිම්බඩ.

ii. ගරු විනීත ස්වාමීන් වහන්සේ, විහාරාධිපති, ශ්‍රී නාගරුක්ඛාරාම විහාරය, දම්පැල්ල.

04. සාමාජික - i. ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
ii. ගරු මන්ත්‍රී නිරෝෂා පුෂ්පාදරි මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභා.ව
iii. ගරු මන්ත්‍රී හර්ෂණී ගුණසේකර මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
iv. ගරු මන්ත්‍රී පී.ජී.තරංගා මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
v. දමයන්ති වර්ණසූරිය මිය, ප්‍රජා පොලිස් ඒකකය, මාලිම්බඩ.
vi. කේ.එන්.සුජීවා ජයලත් මිය, මුල් ළමා විය සංවර්ධන නිලධාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.
vii. ජී.එම්.ජ්.දේනුකා මදූශානි මිය, පරිවාස සංවර්ධන නිලධාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.
viii. අජිත් ප්‍රසන්න මයා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ
ix .යමුනා ද සොයිසා මිය, ළමා හිමිකම් ප්‍රජා නිලධාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.
x. පී.ඩබ්.රංගිකා මිය, උපදේශන නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.
xi. දිල්මි රණවීර මිය, ළමා රක්ෂණ නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.
xii. ආර්.රංජනී මිය, සභාපති, මාලිම්බඩ සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා මණ්ඩලය.
xiii. කේ.ජී.ඥාණරත්න මයා, විශ්‍රාමික රාජ්‍ය නිලධාරී, මාලිම්බඩ
xiv. පී. ඉනෝකා මිය පෙර පාසල් ගුරු, අකුරුගොඩ.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**තීරණ අංක 6:10**</u>

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පහත නම් සඳහන් අයගෙන් යුත් ළමා හා කාන්තා ආරක්ෂණ කමිටුවක් පිහිටුවීමට තීරණය විය.

01. කමිටු සභාපති - සෝමසිරි වීරමන් මයා, සභාපති, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
02. කමිටු ලේකම් - එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය, ප්‍රජා සංවර්ධන නිලධාරී මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
03. අනුශාසක - i. ගරු ධම්මසිරි ස්වාමීන් වහන්සේ, විහාරාධිපති, ඉන්ද්‍රාරාම පුරාණ විහාරය, මාලිම්බඩ.
ii. ගරු විනීත ස්වාමීන් වහන්සේ, විහාරාධිපති, ශ්‍රී නාගරුක්ඛාරාම විහාරය, දම්පැල්ල.
04. සාමාජික - i. ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
ii. ගරු මන්ත්‍රී නිරෝෂා පුෂ්පාදරි මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභා.ව
iii. ගරු මන්ත්‍රී හර්ෂණී ගුණසේකර මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.
iv. ගරු මන්ත්‍රී පී.ජී.තරංගා මිය, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
v. දමයන්ති වර්ණසූරිය මිය, ප්‍රජා පොලිස් ඒකකය, මාලිම්බඩ.
vi. කේ.එන්.සුජීවා ජයලත් මිය, මුල් ළමා විය සංවර්ධන නිලධාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.
vii. ජී.එම්.ජ්.දේනුකා මදූශානි මිය, පරිවාස සංවර්ධන නිලධාරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.
viii. අජිත් ප්‍රසන්න මයා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ
ix .යමුනා ද සොයිසා මිය, ළමා හිමිකම් ප්‍රජා නිලධාරී

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.

x. පී.ඩබ්.රංගිකා මිය, උපදේශන නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.

xi. දිල්මි රණවීර මිය, ළමා රක්ෂණ නිලධාරී, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ.

xii. ආර්.රංජනී මිය, සභාපති, මාලිම්බඩ සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා මණ්ඩලය.

xiii. කේ.ජී.ඥාණරත්න මයා, විශ්‍රාමික රාජ්‍ය නිලධාරී, මාලිම්බඩ

xiv. පී. ඉනෝකා මිය පෙර පාසල් ගුරු, අකුරුගොඩ.

**<u>යෝජනා අංක 6:11</u>**

ගබඩා හා භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ කිරීමේ මණ්ඩලය ලෙස පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| සභාපති | - සෝමසිරි වීරමන් මහතා | - සභාපති |
| සාමාජික | - අසංකා කුමාරි මිය | - ලේකම් |
| | - එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරි |
| | - ඒ.වි.අංජලිකා උදයන්ති මිය | - තාක්ෂණ සේවා නිලධාරී |
| | - බී.ඒ.කුමුදු ශාන්ත මයා | - තාක්ෂණ සේවා නිලධාරී |
| | - අෂාරා පියුමිණි මිය | - ආදායම් පරීක්ෂක |
| | - නිහාල් කරුණානායක මයා | - කළමනාකරණ සේවා නිලධාරි |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:11</u>**

ගබඩා හා භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ කිරීමේ මණ්ඩලය ලෙස පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීමට තීරණය විය.

| | | |
|---|---|---|
| සභාපති | - සෝමසිරි වීරමන් මහතා | - සභාපති |
| සාමාජික | - අසංකා කුමාරි මිය | - ලේකම් |
| | - එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරි |
| | - ඒ.වි.අංජලිකා උදයන්ති මිය | - තාක්ෂණ සේවා නිලධාරී |
| | - බී.ඒ.කුමුදු ශාන්ත මයා | - තාක්ෂණ සේවා නිලධාරී |
| | - අෂාරා පියුමිණි මිය | - ආදායම් පරීක්ෂක |
| | - නිහාල් කරුණානායක මයා | - කළමනාකරණ සේවා නිලධාරි |

**<u>යෝජනා අංක 6:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස ආයතනයේම සිටින පරිගණක දැනුම ඇති පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීමට ගරු සභාව යෝජනා කරන්නීය.

| | | |
|---|---|---|
| සභාපති | - එච්.වයි. ප්‍රදීප් පුෂ්ප කුමාර මයා | - සංවර්ධන නිලධාරි |
| සාමාජික | - එච්.එච්. අසංකා කුමාරි මිය | - ලේකම් |
| | - එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරි |
| | - ජී.ජී.චතුරිකා සුනිල් සම්පත් මෙය | - සංවර්ධන නිලධාරී |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

**<u>තීරණ අංක 6:12</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස ආයතනයේම සිටින පරිගණක දැනුම ඇති පහත නම් සඳහන් නිලධාරීන් පත් කිරීමට තීරණය විය.

| | | |
|---|---|---|
| සභාපති | - එච්.වයි. ප්‍රදීප් පුෂ්ප කුමාර මයා | - සංවර්ධන නිලධාරී |
| සාමාජික | - එච්.එච්. අසංකා කුමාරි මිය | - ලේකම් |
| | - එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය | - ප්‍රජා සංවර්ධන නිලධාරි |
| | - ජී.ජී.චතුරිකා සුනිල් සම්පත් මෙය | - සංවර්ධන නිලධාරී |

**7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

- 2022 වර්ෂය සඳහා මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු පොදු දේපළ (වත්කම්) සඳහා වූ ටෙන්ඩර් විවෘත කිරීම 2021.12.15 දින පෙ.ව.10.30ට පැවැත්වූ අතර එම ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම.

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

- 2021 නොවැම්බර් මාසය සඳහා ඒකාබද්ධ වැය සාරාංශ වාර්තාව සභාව අනුමත කරන ලදී.
- ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශනය - 2021 නොවැම්බර්

**9). වෙනත් කරුණු.**

<u>ගරු මන්ත්‍රී සාගර එදිරිසූරිය මහතා</u>

සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා සියලු දෙනාටම. සභාපතිතුමා කිරිමැටිමුල්ල, උතුර ග්‍රාම නිලධාරී වසමේ හින්නක්මුල්ල නැමති ඉඩම දැන් වෙන්දේසිකරුවකු විසින් වෙන්දේසි කරනු ලබනවා කියලා ප්‍රදේශවාසීන් දුරකථනයෙන් දැනුම් දුන්නා. මේ ඉඩමේ අක්කර 05ක් කලින් වෙන්දේසි කරලා තියෙනවා. එහිදී ගිවිසුමක් තියෙනවලු ඊලග අක්කර 05 වෙන්දේසි කරන කොට සභාවේ කොටස ලබා දෙනවා කියලා. නමුත් හොර රහසේ දැන් අක්කර ½ වගේ කෑලි කඩලා විකුණනවා. චෝදනාවක් තියෙනවා සභාව මේ ගැන සොයා බලන්නනේ නැහැ කියලා. සභාවට ගන්න පුලුවන් පොදු කොටස අරන් දෙන්න කියලා මට කීප දෙනෙක්ම කථා කළා. මේ ගැන හොයලා බලලා අදම දැන්වීමක් ප්‍රදර්ශනය කරමු ඒ විකිනීම් නවත්වන්න කියලා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

මන්ත්‍රීතුමා, ඕක ඊයේ රෑ තමයි මට කිව්වේ. සභාව නිහඬව ඉන්නවා කියන එක ප්‍රතික්ෂේප කරනවා. අපි ගිහින් බලලා ගන්න පුලුවන් උපරිම ප්‍රමාණය ගමු.

කාරක සභාවක් බවට පත්කිරීමට

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී.උදයසාන්ත මහතා

මහ සභාවක් බවට පත්කිරීමට

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

**ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා**

සාගර මන්ත්‍රී තුමා යෝජනාවක් කළා. මේ ඉඩම් වෙන්දේසි වලදී අපි දිගින් දිගටම හැප්පිච්ච තැන් තියෙනවා. මේ වගේ අත්දැකීමක් අපිට තියෙනවා අකුරුගොඩ ශාන්ති වත්ත ඉඩම සම්බන්ධයෙන්. එම ඉඩම වෙන්දේසි කරන අවස්ථාවේදී වෙන්දේසිකරු එකඟ වුනා තමන්ගේ ඉඩමෙන් සභාවට අයිති කොටස දෙනවා කියලා. නමුත් ලැබුනේ නෑ. ඒ නිසා ශාන්ති වත්තෙන් අපිට ලැබෙන්න ඕන පර්චස් 60 ක් අපට නැති වුනා.
විෂය නිලධාරීන් වෙනස් වෙනවා. නිලධාරීන් අලුත් වුණාට නව නිලධාරීන් ෆයිල් අධ්‍යනය කරනවා කියන කාරණාව මම දන්නවා. සභාව නැති කාලේ මේ ඉඩම විකුන්නෙ. හින්නක්කමුල්ල කියන ඉඩම ඒ කාලයේ නියමිත සංවර්ධනයක් වුනේ නෑ. පාරවල් හැදුවේ පත්වුන රජයක් මගින්. විදුලිය, ජලය මේ කිසිවක් නෑ. අනාගත පරපුරට මේවා දායාද වෙන්න ඕන. අනාගත පරපුරේ සහ අද පරපුරේ අවශ්‍යතාවයක් ඉටුවෙන්න ඕන. යටිතල පහසුකම් ඇති වෙන්න ඕන. කඩුකන්නේ වාසනා උයන වෙන්දේසි කරාට ඒකේ පොදු කැල්ලක්වත් නෑ. අක්කර භාගයද වෙන්දේසි කරන්නේ ඒක අදාළ නෑ, සභාවට එන්න ඕන කොටස ගන්න. ඉඩම් වෙන්දේසියෙන් ඉඩම් ලබා ගෙන ණය පහසුකම් ගන්න රාජ්‍ය බැංකුවකට ගියාම පාරේ පළල මදි වෙනකොට මිනින්දොරු මහත්තයෙක් අල්ලලා අඩි 10 පාර අඩි 20ට බොරුවට පෙන්නලා ණය මුදල් ලබා ගන්න මිනිස්සු අසරණ වෙලා තියෙනවා. කිසිම කෙනෙක් තමන්ට ඉඩම ගන්න අවස්ථාවේ ඒ කිසිදු අවශ්‍යතාවයක් පෙන්නුම් කරන්නේ නෑ. ඒ අවස්ථාවේ එයාලගේ අරමුණ ඉඩම ගන්න එක විතරයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, අපිට වගකීමක් තියෙනවා අපි මැදිහත්කරුවෝ වෙලා ඉඩමක් කොතනදි වෙන්දේසි කළත් අනිවාර්යෙන්ම ඒ ඉඩමේ වෙන්දේසිකරු ලව්වා මේ පොදු පහසුකම් ටික සකස් කරගන්න.

**ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා**

වර්තමානයේ එහෙම සිදුවීම් වෙන්න අපි ඉඩ තියන්නේ නෑ. අදාල විෂයභාර නිලධාරිනියත් ඉතා දක්ෂ විදියට ඒ වැඩේ කරනවා. සෑම ඉඩමක්ම වෙන්දේසි කරද්දි ඒ පසු පස යන්න අපි වැඩ කටයුතු සලසලා තියෙනවා. ඒ අදාල වගකීම් පවරලා තියෙනවා. වෙළඳගොඩ ඉඩම වෙන්දේසි කරන කොට අපිට අයිතියක් නෑ ඉඩම් කැබැල්ලක් ගන්න. හැබැයි අපි සුහදව ගත්තා. ඉඩම අනුමත කරන්න එනකොටම අපි කියන්නේ අපිට කැල්ලක් දෙන්න කියලා. ඒ වගේ ඕන ඕන හැටියට ඉඩම් විකුණන්න මේ කාලයේ අපි ඉඩ තියන්නේ නෑ. හැබැයි අපි නොදැනුවත් කමින් කරන දේවල් තියේද දන්නෑ. මන්ත්‍රීවරු 17 දෙනෙක් ඉන්නවා. බල ප්‍රදේශය පුරා ඒ අය විසිරිලා ඉන්නේ. මන්ත්‍රීවරුන්ට යුතුකමක් තියෙනවා තම තමන්ගේ බල ප්‍රදේශයේ ඉඩමක් විකුණනවද? කැබලි කරනවද? පාරවල් දානවද? කියලා හොයලා බලන්න. මන්ත්‍රීවරුන්ගේ ඒ යුතුකම ඉටු කරන්න. ඒවා අපිට දැනුම් දුන්නොත් අපි ඒවාට මැදිහත් වෙනවා. මගේ කාලයේ කිසි කෙනෙකුට ඉඩ දීලා නැහැ තමන්ට ඕන විදියට ඉඩම් කැබලි කරලා විකුණන්න.

**ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා**

නව වසර සුභ වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා සියලු දෙනාටම. ගරු සභාපතිතුමනි, අපිට දක්ෂ නිලධාරිතුමියක් ඉන්නේ වාසනා මිස්. මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට වාසනාව ගෙනත් දෙන නිලධාරි තුමියක්. හැම කටයුත්තකදීම අයවිය යුතු කොටස් අයකරගෙන ඒ කටයුත්ත සිදු කරනවා. මාලිම්බඩ බල ප්‍රදේශය ගත්තොත් පොල් ඉඩම් වැඩිම වශයෙන් තියෙන්නේ සුල්තානාගොඩ කොට්ඨාසයේ. දැන් ඒ කිසිවක් නැති වේගෙන යනවා. මම මීට කලිනුත් කිව්වා මනම්පේරි වත්ත කියලා. දැන් ලේක් සයිඩ් නමින් වෙන්දේසි ඉඩමක් පවත්වා ගෙන යනවා. සරු පොල් ඉඩමක් තිබුනේ. ඒ ඉඩම අද මුඩු ඉඩමක් බවට පත් වෙලා තියෙනවා. අක්කර හතක් වෙන්දේසි කරා. ඉතිරි අක්කර 07ත් වෙන්දේසි කරන්න පිඹුරුපත් සකස් කරනවා කියලා ආරංචියක් තියෙනවා. ඒ මිනිස්සු සූක්ෂම ලෙස පොල් වගාව විනාශ කළා. ලක්ෂ ගාණක් වියදම් කරලා පොල් ඉන්දලා නවීන් දිසානායක ගරු ඇමතිතුමා ඉන්න කාලේ

කරපු ලොකු ව්‍යාපෘතියක් ඒක. ඒවා සියල්ල පැත්තකට දාලා තමයි ඒ කාරණාව සිද්ධවුනේ. ඒ සියල්ල දැන් සිදුවී අවසානයි. බොහෝම ශ්‍රමයක් දරලා අපට ගැලපෙන විදියට පරිසර හිතකාමී විදියට ඒ ව්‍යාපෘති ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් සිදු වුනා. වැවට පස් සෝදාගෙන ඇවිල්ලා විශාල හානියක් වෙච්ච එකක් තාප්පයක් දාලා නැවැත්තුවා. අපි ඒ වෙන්දේසිය නවත්වන්න උත්සාහා කළා. නමුත් වෙනත් ආයතන මැදිහත් වෙලා ඒක කරලා දුන්නා. දැන් සභාපතිතුමනි පිඹුරුපත් හදනවා වැවට ඉහත්තාවේ තියෙන විල්ප්‍රඩ්වත්ත කියන අක්කර 100ක ඉඩම වෙන්දේසි කරන්න. දෙපාරක් ඇවිල්ලා වාරි මාර්ගයෙනුත් බැලුවා. මට දැන ගන්න ඕන සභාපතිතුමනි ඒ කටයුත්ත සම්බන්ධව සභාවෙන් ඉල්ලීමක් වත් ඇවිත් තියෙනවාද කියලා. නිවාස සංකීර්ණයක් ඉදිකරන්න පලේවිල පාරට මුහුන දාලා අක්කර 25ක් වෙන් කරලා. ගමේ මිනිස්සු කියන්නේ රජයේ නිලධාරීන් වාහන වලින් ඇවිල්ලා සතියකට දෙවරක් විතර බලනවා කියලා. රැට රැට මැෂින් දාලා ගස් කපනවා කියනවා. කන්ද මුදුනේ පොල් ගස් ඉවත් කිරීමක් මේ වන විට කරනවාලු. ඉතින් ගරු සභාපතිතුමනි, ඔබතුමාට බලය තියෙනවා පොලිසිය මාර්ගයෙන් ඒ ඉඩම් වලට ඇතුලුවෙන්න. මේ බල ප්‍රදේශයේ කුඹුරු අක්කර සිය ගණනක් වගා කරන සරු වැවක් තියෙන්නේ එච්චරයි. පායන කාලෙට හිඳෙන්නේ නැහැ. දැන්නම් ඒ කරන කටයුතු නිසා වැව ගොඩ කිරීමේ කටයුතු වටේ අයත් සිදු කරනවා. මේ සම්පත රැක ගන්න ඒ ඉඩම් වෙන්දේසියකට ඉඩ නොදී අපි තදින් පෙනී ඉන්න ඉන්න කියන කාරණය මතක් කරනවා. රිසිවේෂන් තියෙන්නේ. ඔබතුමාගේ බලය පාවිච්චි කරලා ගමේ මිනිසුන්ගේ මේ කසුකුසුවේ නිවැරදි තාවය තහවුරු කරගන්න ඔබතුමාගේ මැදිහත් වීම කරන්න කියලා සිහිපත් කරනවා.

<u>ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා</u>

සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. අපි මේ වන විට උඩවත්තේ ඉදලා කිරිමැටිමුල්ල මාර්ගය උඩවත්ත පන්සල මාර්ගය කාපට් කරන්න සංවර්ධනය කරමින් පවතිනවා. එතන උඩවත්ත පාරේ වෙලත් එක්ක ලොකු ඉඹුල් ගහක් තියෙනවා. RDA එකෙන් කතා කරලා කිව්වා ඉඹුල් ගස කපලා ඉවත් කරලා දෙන්න කියලා. මං යෝජනා කරනවා සභාව මගින් මැදිහත් වෙලා ඒක කපලා ඉවත්කරන්න කියලා.
මුලින් යෝජනාවක් කළා අධිකාරිවිල ප්‍රජා ශාලාව මතට පතිත වී ඇති ගස් අතු කපා ඉවත් කළ යුතු බවටත්, වහලේ බිඳී ඇති උලු කැට පිළිසකර කල යුතු බවටත්, මේකේදී මට තව යෝජනාවක් කරනවා අපිට සභාවට ගස් කපන කෙනෙක් ගන්න පුල්වන් නම් ගන්න කියලා. මොකද අපි හැමදාම ගස් කපන අයගේ පස්සෙන් යන්න ඕන.
ඒ වගේම අපි දැනට පොඩි අපහසුතාවයකට පත්වෙලා තියෙනවා වීපී පහන් නඩත්තු කිරීමේදී. ඒ නිසා පුලුවන් ඉක්මනින් ඒ බඩු අරන් දීලා ඒ කටයුතු ඉක්මන් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී බන්දුල දික්මාදුගොඩ මහතා</u>

ගරු සභාපතිතුමනි , අකුරැස්ස වතුයායේ කොරහිලගොඩ වතුයායේ කන්දගේන කොටසේ ඇල්ගිරිය මායිමේ රබර් උගුලනවා. ඒ රබර් ගෙනියන්න බැකෝ එකක් දාලා පාරවල් කපලා ඒ තුලින් දොළ පාර ඇවිත් මිනිසුන්ගේ ගොවිතැන් හා දේපළ විනාශ කරනවා. වතු අධිකාරී විසින් කිසිම පියවරක් මේ වන තෙක් අරගෙන නෑ. පහල කපලා දැන් ඉහත්තාව කපනවා. ඒ නිසා මිනිස්සු විශාල ප්‍රමාණයක් අසාධාරණයට ලක්වෙලා. එබැවින් වතු අධිකාරී දැනුවත් කරලා නිසි පියවරක් ගන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.

<u>ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා</u>

සභාපතිතුමා ඇතුලු සියලු දෙනාට නව වසර සුභ වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා. සභාපතිතුමා, මං මේ කතා කරන්නේ බල ප්‍රදේශයේ පරිහානියට පත් වෙමින් යන පාරක් ගැන. නාපේ කන්දෙමග පාර කියන්නේ දෛනිකව විශාල ළමුන් ප්‍රමානයක් හා ජනතාව විශාල වශයෙන් භාවිතා කරන හොරගොඩට පිවිසෙන්න, හොරගොඩ ප්‍රධාන මාර්ගයට වඩා

මිනිසුන් භාවිතා කරන පාරක් . ඉස්සර තිබුනු අඩිපාර විශාල මුදලක් වෙන් කර සකස් කල මාර්ගයක් මේක. මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මැදිහත් වුනා. බල ප්‍රදේශයේ බොහෝම සාර්ථක නිමාවකින් යුක්තව නිමකළ පාරක් ලෙස කියන්න පුලුවන්. නමුත් අද නිතරම යන එන අයට දක්නට ලැබෙන්නේ මාර්ගය දිනෙන් දින අභාවයට යන බවක්. මොකද මාර්ගයේ කාණු පද්ධතිය සම්පූර්ණයෙන්ම ඇහිරිලා. මාර්ගය උඩින් පසුගිය කාලේ තිබුනු ධාරානිපාත වර්ෂාවෙ වතුර කඳ ගලාගෙන ගියේ. ඒ නිසා මාර්ගය දෙපස තියෙන සියලුම නිවාස වලට ගොඩවෙන්න තියෙන තැන් කිසිවක වතුර බසින සිලින්ඩරයක් යොදලා නෑ. ඒ නිසා හැම තැනකින්ම පසුගිය කාලේ බ්ලොක් වෙලා කඳු හෝදගෙන ඇවිත් බොහෝ තැන්වල පස් කඳු ගොඩගැහිලා. රාජකීය විදුහල හා තෙලිජ්ජවිල මධ්‍ය මහා විදුහලට හොරගොඩ, වැල්ලාන ප්‍රදේශයට දුර ඉඳන් එන දරුවෝ පවා එතනින් ගියේ. ගම්වාසීන්ගේ ඉල්ලීම පරිදි JCB යන්ත්‍රය යොදවලා ඒක යම් තත්වයකට සකස් කළා. ඒක එයට නියම පිලියමක් නෙවෙයි. ගරු සභාපතිතුමාගෙන් ඉල්ලනවා නිවෙස් වලට යන්න අසුරගෙන තියෙන තැන් ඒ වලට සිලින්ඩර් දාගන්න එයාලට උපදෙස් දීලා කාණු පද්ධතිය සකස් කරලා දීලා මේ මාර්ගය ආරක්ෂා කර ගන්න වැඩ පිළිවෙලක් සකස් කරන්න කියලා. ඒ වගේම නාකන්දගොඩ කියන ඉඩමේ අව්ධිමත් වගා කිරීමේ වැඩපිළිවෙලත් පස් කඳු කඩා වැටෙන්න හේතු වෙලා තියෙනවා. ඒ ගැන කිසිදු දැනුම් දීමක් ඒ ඉඩම් හිමියන්ට කරලා නෑ. තාක්ෂණ නිලධාරීන් හා අදාළ නිලධාරීන් යොමු කරලා ඒ මාර්ගය ඉතා ඉක්මනින් සකස් කරලා මෙය අභාවයට යන්න නොදී ආරක්ෂා කර ගන්න වැඩපිළිවෙලක් සකස් කරන්න කියලා ඉල්ලනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

ජනතාවගේ ඉල්ලීමක් අනුව අපි කානුවක් කැපුවා. ඔය මාර්ගය දිගට කපාගෙන යන්න මං මැෂින් එකක් එවන්නම්. ඒකට මැදිහත් වෙලා ඒක කරන්න. ඕක කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහනට යොමු කරමු. එතෙක් කාණුව කපමු.

<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>

මට කරුණු 2ක් තමයි කියන්න තියෙන්නේ. මේක සභාවට අයිති කාරණාවක් නෙවෙයි. නමුත් මේක දැනුවත් කරන්න ඕන දෙයක්. RDA හරි PRDA හරි කද්දුව ප්‍රධාන මාර්ගය සකස් කිරීමේදී කද්දුව හන්දියේ සිට මුත්තෙට්ටුමුල්ල දක්වා ABC දාලා පාර තලලා හැදුවා. ඒක හැදුවට දැන් ඒ මාර්ගය පයින්වත් යන්න බැරි තරම් අති දුෂ්කර තත්වයට පත් වෙලා. දිනපතා බස් 14ක් පමණ ධාවනයේ යෙදුනා. කද්දුව සිට මාතර දක්වා යන්න තියෙන ප්‍රධාන මාර්ගයක් මේක. ඒ වගේම කටුවන්ගොඩ මල්පියලි ගෙදර ගාව පාර දෙපැත්ත කණු ගහල තියෙනවා. එතන මිනිස්සු ඇදගෙන වැටෙනවා. ඒ වගේම බයික් විශාල ප්‍රමාණයක් ඇදගෙන වැටුනා. අපේ රජයට අගෞරවයක් වෙනවා ඒකෙන්. මේ ස්ථාන දෙක යථා තත්වයට පත් කරන්න ඔබ තුමා ඉහළ අංශ දැනුවත් කරන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>

ලැබුවා වූ නව වසර සාමය සතුට සෞභාග්‍ය පිරි අතමිට සරු ආර්ථික වියදම් නැති, බඩු මිල අඩු යුගයක් වෙන්න කියලා සියලු දෙනාටම ප්‍රාර්ථනා කරනවා.
ගරු සභාපතිතුමනි, සංස්කෘතික මධ්‍යස්ථානය ගැන මං අහන්න හැදුවේ. ගම තුල ප්‍රශ්නයක් තියෙනවා මේ වෙලාවේ කිරිමැටිමුල්ල සංස්කෘතික මධ්‍යස්ථානය නැවත මාලිම්බඩට ගේන්න හදනවා කියලා. ගමේ අය කිහිප දෙනෙක් විමසුවා. ගරු මහින්ද යාපා අබේවර්ධන කථානායක තුමාට අපි ස්තූතිවන්ත වෙනවා මේ සංස්කෘතික මධ්‍යස්ථානය කිරිමැටිමුල්ලට ලබා දීම ගැන. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ෆවුන්ඩේෂන් එකක් දමන්න හදපු වෙලාවේ එවකට ගරු මුදල් ඇමතිව සිටි මංගල සමරවීර මැතිතුමා ඒක නැවැත්තුවා. මේ වන විටත් සංස්කෘතික මධ්‍යස්ථානයේ වැඩකටයුතු ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානයේ ධර්ම ශාලාවේ පවත්වාගෙන යනවා. කිසිම බාධාවකින් තොරව ස්වාමීන් වහන්සේ පූර්ණ සහයෝගය දෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල හදලා ඒ වැඩකටයුතු අවසන් වන විට සංස්කෘතික

මධ්‍යස්ථානය මාලිම්බඩට ගෙනියන්න හදනවද කියලා මං දන්නෑ. සභාපතිතුමාගෙන් අහලා දැනගන්න අවශ්‍යයි. වැඩිම ජනගහනයක් සිටින ප්‍රදේශයක් හැටියට ඒ සංස්කෘතික මධ්‍යස්ථානය කිරිමැටිමුල්ල හංදියේ තිබුනොත් තමයි හොද. හදිසි මොන්ටිසෝරි උත්සවයක් තියන්න, හදිසි රැස්වීමක් තියන්න, සුදුසු ඉඩක් තියෙන තැනක් ඒ කිරිමැටිමුල්ල හන්දියට ආසන්න ස්ථානයක නෑ මේ කොට්ඨාශය තුල. ඒ නිසා එහෙම ගේන්න හදනවනම් සභාපතිතුමනි ඒක ගේන්න එපා. මේ වන විටත් සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්ලෑන් එක රැස්වීම් ශාලාවක් සමග හදලා තිබුණා. ඒ ගොඩනැගිල්ල රජය විසින් හරි මුදල් ටිකක් දාලා කිරිමැටිමුල්ලේ හදන්න කියලා ඉල්ලනවා.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.30 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව